ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2015 මාර්තු 30 සඳුදා
07 වෙළුම -22 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 21/ News/ 2015

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## පාස්කුවේ දුක්ඃප්‍රාප්තිය තුළින්

# ක්‍රිස්තු උත්ථානයට සූදානම් වෙමු !

Lama Pradeepaya

සිතුවම : ගයනි තරුෂිකා

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# දරුවනේ, උත්ථානයෙන් තොර විමුක්ති මඟට අර්ථයක් නැහැ.

## ආදරණීය දුවේ පුතේ...

ඉමහත් ධර්ම වටිනාකමක් හා විශ්වාසයේ හර පද්ධතිය කැටි කරන, එලෙසම අගනා කිතුනු ජීවිත පැවැත්මේ පදනම පිළිබඳව සම්පූර්ණයෙන්ම පවසාලන පාස්කු සමය ඇරඹුනා. ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම හා මරණය තුළින් ගෙන ආ ගැලවීමේ මහා සම්පූර්ණ ක්‍රියාවලිය ජීවනයේ අගනාම සංකේතය බවට පත්වන්නේ ඔවුන්වහන්සේගේ උත්ථානය තුළින් බව අපි මනාව වටහා ගන්නට ඕනා. අපේ කිතුනු බවේ සැබෑ වටිනාකම ගැබ් වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය තුළයි. අපි උත්ථානයේ ජනතාවක්. තව දුරටත් වැළපෙන , දුක්වෙන , කඳුළු හලන , විලාප නඟන ජනතාවක් සේ අපිට ජීවත් වන්නට බැහැ. පාප අන්ධකාරයේ තව දුරටත් ඇලී ගැලී ජීවත් වන්න අපට බැහැ.

ආදර දුවේ පුතේ,

ක්‍රිස්තුන් වහන්සේ මිනිස් අපගේ දුර්වල පැවැත්මයි, තමන් වහන්සේ වෙතට පවරා ගත්තේ. ඒ පාපය දුරස් කරලා, අන්ධකාරය ඉවත් කරලා, පිරිපුන් බවකින් කිතුනු ජීවිතය භාරගන්නට හා එහි උරුමය පවසන්නට උත්ථානයේ සමිඳුන් පුංචි ඔබට ආරාධනා කරනවා. උත්ථානයේ ජනතාවක් හැටියට ජයග්‍රාහී කුරුසියේ පහස ලබන ඔබ, ඔබේ කිතුනු විශ්වාසයට අවංක වන්නට ඕනා. එහි සාක්ෂි කරුවන් බවට පත් වෙන්න ඕනා. ඒ පණිවිඩය ජීවත් කරවන ජීවමාන සංකේත බවට පත් වෙන්න ඕනා.

ක්‍රිස්තුන් වහන්සේ මරණයෙන් තුන් දිනකට පසු ඒ මරණය පරාජය කලා. පාපය පරාජය කලා. අජරාමරව උත්ථානයේ මහා සම්මත පණිවුඩය තුළින් හමා ආ ශුද්ධාත්ම ජීවනාලිය තුළ කිතුනු අපට සැඟවී ජීවත් වන්න බැහැ. ප්‍රේමයේ උතුම් පණිවුඩයක් ගෙන ආ උත්ථානයේ සැබෑ සත්‍යතාවය තුළ අපි කිතුනුවන් බවට පත් වු සේම ඉදිරියට යන ධෛර්ය සම්පන්න කිතුනුවන් සේ සුවිශේෂී වටිනාකම් වලටත් අවනත වන්නට අවශ්‍යයයි. ඒ අවනත වීම තුළ සමස්ත ශුද්ධවු සභාව ජීව හුස්ම හෙලනවා. වසර දෙදහස් දහයකට අධික කාලයක් තුළ හමා ආවේ ඒ ජීව හුස්ම තුළ පණ ගැන්වු සීල සුවඳයි.

ශුද්ධවු සභාවේ ප්‍රාණ පරිත්‍යාග ශිලිවරුන් බිහිවන්නට , සත්‍ය දහමට ජීවිතය පුද කිරීම තුළින් සාක්ෂය දරන්නන් බිහිවීමට, සමස්ත සාන්තුවර දැක්මේ ක්‍රිස්තු අනුගාමිකයන් බිහිවන්නට මුලික වුයේ මේ උත්ථානයේ පණිවුඩයයි.

මරණය වැළඳගත් ජනතාවකට හා අන්ධකාරයේ ගමන් කරන ජනතාවකට මේ ආලෝකයේ, ජීවනයේ උත්ථාන පණිවුඩය තේරුම් ගන්නට අපහසුයි. ඒ නිසා ඔබ අන්ධකාරයේ මාවත තුළ ගමන් කරන දරුවන් නොව ආලෝකයේ ජයග්‍රහී මාවත තුළ ගමන් කරන දරුවන් බව නිරන්තරයෙන්ම අවබෝධ ගන්න ඕනා. ඒ පැවැත්මට සම්පූර්ණයෙන්ම සම්බන්ධ වෙන්න ඕනා.

කිතු සමිඳුන් ලොවට ගෙනා ඒ උතුම් සුවිශේෂී වටිනාකම් ක්‍රිස්තු දැක්මෙන් විහිඳ හරින්නට අපට බලය ලැබෙන්නේ උත්ථානයේ ජීව ශක්තියෙන්මයි. ඒ ශක්තිය තුළයි, එදා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් නොබියව ගමන් කළේ. අන්‍ය ජාතිකයන් වෙතට ගමන් කරන්නට ඔවුනට සම්පූර්ණ ශක්තිය ලැබුණේ මේ උත්ථානයේ බල මහිමයෙන්මයි. එම නිසා ආදර දුවේ පුතේ, අද මේ දේශයේ අනාගතය භාර ගන්න ඉන්න ඔබ හැම දෙනාම ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ පණිවුඩය තුළින් ධෛර්ය මත් ළමා පරපුරක් බවට පත් වීම අත්‍යවශ්‍යයයි. ජීවිත හැඩ ගැස්මෙන් හා වටිනා කම් හරයාත්මකව ජීවිතයේ වර්ධනය කර ගැනිමෙන් සුවිශේෂී දහම් පණිවුඩයේ වාහකයන් බවට පත් වීම අත්‍යවශ්‍යයයි. තවත් ක්‍රිස්තුවරයෙක් වෙමින් ඒ සුබාරංචිය තවත් ජනතාවක් වෙත ගෙන යන පණිවුඩකරුවන් වීම අත්‍යවශ්‍යයයි.

දේව රාජයේ සැබෑ සළකුණු හඳුනාගෙන ඒ අනුව ජීවත් වෙමින් මරණය ජයගත් අප සමිඳාණන්ගේ උතුම් පහස තුළ උත්ථානයේ දරු පරපුරක් සේ ගමන් කරන්නටයි, ඔබට කරන මේ ආරාධනා !

පුංචි ඔබ සැමට සුබ පාස්කු මංගල්‍යයක් වේවා !

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# දේව ආදරයේ පහස ලබමු



ආදම් සහ ඒව, "උයනේ සියලුම ගස් වලින් ගෙඩි කෑමට නුඹට නිදහස ඇත. එහෙත් හොඳ නරක අවබෝධ කිරීමේ ගසින් පමණක් නොකෑ යුතුය" යන දේව අණට අකීකරු වීමෙන් පාපය නැමැති අන්ධකාරය මෙලොවට ඇතුළු විය. පාපයේ ආදීනව ලෙස පහත සඳහන් දේ සැලකිය හැකිය.

□ දෙවියන් වහන්සේ හා මිනිසා අතර සබඳතාවය පළුදු වීම.
(පාපයෙන් පසු මිනිසා දෙවියන් වහන්සේගෙන් සැඟවෙයි)

□ මිනිසා හා මිනිසා අතර සබඳතාවය පළුදු වීම.
(තමන් නග්න ව දැනී ඉණ වැසුම් සාදා ගනිති, පුරුෂයා ස්ත්‍රිය පිට සිය ආධිපත්‍යය පතුරුවයි.)

□ මිනිසා හා මිනිසා අතර සබඳතාවය පළුදු වීම.
(කටු පඳුරු ද වල් පැළෑටි ද බිහි වීමෙන් මිනිසාට දහදිය හෙලමින් අමාරුවෙන් වැඩ කිරීමට සිදු වීම)

දෙවි සමිඳාණන් වහන්සේ ස්ත්‍රියට දඬුවම් කරමින් දරු ප්‍රසුතිය වේදනාකාරි කරන බවත්, ඇය තම ස්වාමි පුරුෂයාගේ ආධිපත්‍යයට යටත් වන බවත් වදාළ සේක. එමෙන්ම උන් වහන්සේ මිනිසාටද දඬුවම් කරමින් දිවි ඇති තාක් වෙහෙස මහන්සි වී ආහාර උපයා යුතු බවත්, ගිවිසුම කඩ කිරීමෙන් මිනිසා මරණය උරුම කරගන්නා බවත් වදාළ සේක.

පාපය නැමැති රකුසා සෑම කෙනෙකුගේම දොරකඩ ළඟ සිටින්නේය. වර්තමාන ලෝකයේ වංචා, දූෂණ, අපචාර ලිංගික අපයෝජනය, හිංසාව, නවක වදය, මිනීමැරුම්, සියදිවි නසා ගැනීම, වද හිංසා, ත්‍රස්තවාදය ආදි මිනිසත්කම නසන පාපකාරී ක්‍රියා දෙගුණ තෙගුණ වන බව අපට අසන්නට දකින්නට ලැබේ. දේව සමානකටම මවන ලද මිනිසා මෙසේ තමා ලද නිදහස අයුතු ලෙස භාවිතා කරමින් දෙවියන් වහන්සේට විරුද්ධව පව් කිරීමෙන් තම ජීවිතයේ තිබූ ගෞරවය, අන්‍යෝන්‍ය සම්බන්ධය, සුහදතාව, පරිසරය හා දෙවියන් වහන්සේ සමඟ තිබූ සියලු බැඳීම් නැති කර ගත්තේය. එහෙත් දෙවියන් වහන්සේ කිසි දිනෙක මිනිසාව අත්නොහැරිය සේක. ඔවුන් වහන්සේ ලෝකයාට කෙතරම් ප්‍රේම කළ සේක්ද කීවොත්, මුළු මනුෂය සංහතිය පාපයේ අන්ධාකරයෙන් ගලවා ගැනීම සඳහා ස්වකීය එක් ජාතක පුත්‍රයාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව මෙලොවට දෙවා වදාළ සේක. එසේ කළේ, උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිසය.

මිනිස් සංහතියේ පාපයේ විපායක තම කරට ගෙන, සකල මනුෂය සංහතියේ විමුක්තිය පතා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිතය ඔවුන් උදෙසා දෙවිපියාණන්ට කැප කළ සේක. එහි ප්‍රතිඵලයක් ලෙස අන්ධකාරයේ පාලනය මුළුමනින්ම පරාජය කරමින් මුළු මනුෂ්‍ය සංහතියට විමුක්තියේ ආලෝකය උදා විය. ජේසුස් වහන්සේ මරණය පරදා උත්ථාන වූ දින ශ්‍රාවකයන්ට දර්ශනය වී ඔවුන් පිට හුස්ම හෙළා "ශුද්ධාත්මයාණන් පිළිගන්න, ඔය යමෙකුගේ පව් කමා නොකරන්නහුද, ඒවා කමා නොකරනු ලැබෙයි" යි ඔවුන්ට වදාළ සේක. මෙහිදී ක්‍රිස්තුන් වහන්සේ සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානය ස්ථාපිත කළ සේක.

දේව දරුවකු වීම සඳහා ලබා ඇති කැඳවීම හා මිනිස් ගෞරවයේ කෙලෙසීම නිසා ශු. සභාවේ අධ්‍යාත්මක ජීවිතයට කැළලක් සිදු වේ. විශ්වාසයේ ඇසින් බලන විට ඇති භයානක දේ පාපයයි. එහි අයහපත් ප්‍රතිඵල පුද්ගලයාට, ශු. සභාවට සහ මුළු ලෝකයාටම විඳීමට සිදුවේ. අප මේ මොහොතේ දී ලබා ගත යුතු උතුම්ම ත්‍යාගය නම්, දෙවියන් වහන්සේ සමඟ සමගි වීමයි. ඒ සඳහා තමාගේ සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් සහ අතපසු කිරීමෙන් කරන ලද පාප වලට පසුතැවිලි වී තම පාපී බව පිළිගෙන ඒවා නැවත නොකිරීමට අධිෂ්ඨාන කරගනිමින් සමඟි සන්ධානයේ ප්‍රසාද හා චිත්ත ප්‍රීතිය ලැබෙනු ඇත.

ඒ කෙසේ වෙතත් සමහරුන්ට සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ගැනීමට බාධා ද ඇත. ඒවා කිහිපයක් පහත දක්වා ඇත.

□ නිදහසට කරුණු පෙන්වමින් අවස්ථාව මග හැරීම.
□ තමා පව් කර නැතැයි සිතීම.
□ පව් කමාව ලබා ගැනීම සඳහා සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානය අවශ්‍ය නැතැයි සිතීම.
□ දිව්‍ය පූජාවේ පශ්චත්තාපික පිළිවෙත හා සමඟි සන්ධාන ප්‍රසාද නිධානය සමාන ලෙස සිතීම.

මේ සියලු බාධක වලට හසු නොවී දෙවිපියාණන් වහන්සේ හා නැවතත් සමඟි වීමට මෙම සුවිශේෂ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට දෙවියන් වහන්සේගෙන් අපි ශක්තිය හා වරම් ඉල්ලා යාච්ඤා කරමු. ඔබ තවමත් ප්‍රමාද නැත. වත ඉරාගන නොව සිත ඉරාගෙන උන්වහන්සේ වෙතට නැවත හැරී එනතුරු අපගේ ආදරණීය දෙවිපියාණන් වහන්සේ ඉවසීමෙන් බලා සිටිනු ඇත.

**මරියා ක්‍රිස්ටිනා ප්‍රනාන්දු**
2014-අ.පො.ස. (සා.පෙළ)
**ශු. පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය.**

# කුරුසියේ මාර්ගයෙන් ජීවිත අභියෝග ජයගනිමු



ආදර දුවේ පුතේ, කතෝලිකයින් වන ඔබ අපි සියළු දෙනාම හරිම වාසනාවන්තයි. ඒ වාසනාවන්ත කමේ ජයග්‍රාහී ලාංඡනය තමයි කුරුසිය. කුරුසිය පැළඳගන්නා, කුරුසිය විශ්වාස කරන්නා, කුරුසිය ගෙන ගමන් යන අය නිතරම ආරක්ෂිතයි. ඒ හැම දෙනාවම දෙවියන් වහන්සේ ආරක්ෂා කරනවා. ඔවුනට මග පෙන්වනවා. ඉතින් දුවේ පුතේ වසර 2015 කට පෙර ජේසුස් වහන්සේ මියයන්නට පෙර කුරුසිය කියන්නේ භයංකර , පිළිකුල් සහගත ලාංඡනයක්. එදා සමාජයෙ කුරුසිය දංගෙඩියක්. කුරුසියට එදා සමාජය හරිම බයයි. නමුත් ජේසුගේ ජීවිත පූජාවෙන් පස්සේ කුරුසිය මිනිසාගේ ජය සංකේතය වුණා. ගැලවීමේ ලකුණවුනා. මිනිසා අතර හරිම ජනප්‍රිය ලාංඡනය වුනා. කුරුසියට තිබුන බව නැතුව ගියා.

කිතුනුවන් වන අපිට සෑම වසරක් තුළම සිතන්නට, මෙනෙහි කරන්නට කාලසීමවන් දෙකක් තියෙනවා. ඒ ජේසුගේ උපත සිහිකරන නත්තල් කාලය සහ ජේසුගේ මරණය සිහිකරන පාස්කු කාලය. බලන්න මේ ලෝකය මවා සියළුම සැප සම්පත් අප සතුකළ දේව තාත්තාගේ එකම පුතාට මෙලොව උපදින්නට තැනක් එදා සමාජය දුන්නේ නෑ. එතුමා ඉපදුනෙ ගව මඩුවක. පිදුරු ගොඩක. ඉන් පස්සේ හරි දේ කියාදීපු නිසා මඟ පෙන්වලා දීපු, වැරදි දේ පෙන්වල ඒවාට එරෙහිව පහරදුන්න තරුණ ජේසුව කුරුසියක ඇණගහලා ඝාතනය කලා. ඒ සිද්ධිය සිහිගන්වන දින හතලිහ කාල පරාසය තමයි අළු බදාදායින් ආරම්භ වෙලා මහා සිකුරාදායින් අවසන් වන්නේ. ඒ කාලයට තමයි ''එතරවීමේ කාලය'' කියන්නේ.

ඒ කාලය තමයි කතෝලික අපේ වරප්‍රසාද ජනකම කාලය. ගෙවුන වසර තුළදී අප අතින් සිදුවුන වැරදි අතපසුවීම් මග හැරීම් සිත් නොහොදකම් ආදී සියළුම දේ සිහියට නංවාගෙන හරිදේ කරමින් අතපසුවූ අධ්‍යාපන කටයුතු වලට නැවත අත දෙමින් ඔබලාගේ ළමා ජීවිතය අඩපණ කරනට මාන බලන රූපවාහිනිය, පරිගනකය, ජංගම දුරකතනය ආදියෙන් ලබාදෙන අනවශ්‍ය දේ මග හැර අළුත් ජීවිතයක් තුළින් එතර වන්නට මේ අගනා කාලය සහා මාතාව අපට ලබා දීලා තිබෙනවා.

ඒ නිසා එම ලස්සන කාලයෙන් ප්‍රයෝජන අරගෙන දේව මෙහෙයයන්, පාද නමස්කාර මෙහෙයයන්, පශ්චත්තාපික මෙහෙයයන් වලට හවුල්වී ඔබගෙන් ගිලිහී ගිය, ඔබගෙන් නැතිවී ගිය, ඔබට අතපසුවුන සියළුම දේ ගැන මෙනෙහි කරලා අධ්‍යාපනය නමැති සාරධර්ම යායේ ඇති සියළුම ඵල නෙලා ගන්නට ජේසුගේ ජීවිත පරිත්‍යාගයෙන් ඔබලට ලබාදුන්න මෙම ප්‍රසාද ජනක කාලය ප්‍රයෝජනයට ගන්න වෙරදරන්න. ඔබ සැමට සුබ පාස්කු මංගල්‍යයක් වේවා.

**එම්.ජෝ.පාරිස් මාමා - වැලිවිට**

මාසික සිතිවිල්ල



**මාසික සිතිවිල්ල**

**"මාර්තු / අප්‍රේල් මාසය"**

ළමා ප්‍රදීපය, අංක 02,

ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

# පෙම්බර ජේසුනි

සමිඳුනි ඔබේ නමින් දිවුරා
මම පව් කෙරුවා........
අන් අය ඉදිරියේ හොඳ නම ගන්නට
ඔබ පසු පස ආවා........
සිතට එකඟව ඔබව නොහඳුනන
ඔබ මා හැඳින ගත්තා......
මගේ පාපය වැටෙහෙනා විට
කුරුසේ සිට ඔබ මා දෙස බලලා
කමාව දෙන්නට නිහතමානී වුවා.......
තුති වේ........ ප්‍රසංසා වේ .......
ආදර ජේසුනි සැමදා .......

**නිමේෂා මධුශානි**
2014 - අ.පො.ස (සා.පෙළ)
**සා. මරියා දහම් පාසල**
**හාල්දඬුවන**



ජේසු සමිඳුනේ ඔබට ආදරේ නැති මිනිස්සු
නොකිව් බොරු චෝදනා ගොතලා කිව් මිනිස්සු
පිලාත්ගෙන් ඔබව මරන්නැයි ඉල්ලුව මිනිස්සු
කුරුසියේ ඇණ ගසලා ඔබව මැරුවා මිනිස්සු

තුන්දිනකින් උත්ථානය දුටුවා ඒ මිනිස්සු
පසුතැවුනා දෙව් පුතු යයි ඒ මිනිස්සු
නොදැන කල වරදට සමාව ඉල්ලුවා ඒ මිනිස්සු
ඔබෙන්ම ගැලවීම ලැබුවා ඒ මිනිස්සු

**රශ්මි හිරන්**
07 ශ්‍රේණිය
**සා. මරියා දහම් පාසල - මතුගම**

පිපාස වෙමි මා සමිඳේ
මුදනු මැන අප සැම අඳුරු පාපෙන්
දෙවියනි අප සැම පිපාසෙන්
ගලවා ගන්න ඔබ දෑත් දිගුකර

පාස්කුව නැමැති එතෙර වීමෙන්
එතෙර වන්නට මං තැනීමට
දෙන්න අප හට වරම් සමිඳේ
එගොඩ වන්නට අඳුරු පාපෙන්

**ඈන්ටන් හංසික**
2014 අ.පො.ස (සා.පෙළ)
**සා. මග්දලා දහම් පාසල**
**දුංගල්පිටිය (කැපුන්ගොඩ මීසම)**

විමුක්තියේ පහන නිවිලා
එළිය දුරු වෙලා
අඳුර ඩැහැගත් ලොව තුළ
මා නිහඬ වෙලා
ජීවිතය අභියෝගයකි
මේ ලොවෙහි වැටි මා තනිවුනේ
ඇයිද? දෙවියනේ........
මගේ ජීවිතය කල්වාරි ගමනකි
අඳුරෙන් මිදෙන්නේ
කවදාදෝ මා......
මගේ ගැලවීම ඔබයි ජේසුනි
විශ්වාසය තබමි
ඔබකෙරෙහි සැමදා....

**සුසන්තා ජයසිංහ**
11 ශ්‍රේණිය
**ශ්‍රී හෘදයේ දහම් පාසල**
**කටුගස්තොට**

ගෙත්සමෙනියට වී ඔබ පියාණන් යදින රාවේ
ලෝ පුරා රැව් දුන්නා
දුක් මුසු වී ඔබේ නෙතින් ගැටි කඳුළු බිංදු
මුළු ලොවක් හැඬෙව්වා
කස පහර කමින් ලේ බිඳු හෙලමින් ඔබ දැරූ වේදනා
මුළු ලොවක හදවත සිදුරු කළා
ඉසිලිය නොහැකි වු දුක් දරමින් මරිය මවින්
ඔබ දෙස බලා සුසුම් හෙළුවා
කුරුසිය මත ඔබ උකුත් වු සැනින් අහස් ගැබ
කළු වලාවෙන් පිරී ගියා
මරිය මග්දලේනා ඇතුළු පිරිසක් කුරුසිය පාමුලට වී
දුක් කඳුළු වැගුරුවා
මුළු ලෝ දනන් කම්පා වෙමින් මළු ලොවම
මල ගෙයක් වගේ වුණා.

**ඈන් පියුමි සපරමාදු**
09 ශ්‍රේණිය
**ලොයොල විදුහල - බෝපිටිය**



**කවීශර සිතුමිණ**
**02 ශ්‍රේණිය**
ශු. ෆ්‍රැන්සිස් ද සාලෙස්
දහම් පාසල
දළුගම



**දේසිරි මනතුංග**
**08 ශ්‍රේණිය**
සිරිකුරුස
දහම් පාසල
ගම්පහ

# දෙවිඳුන්



එදා හිරු රශ්මිය අධික ලෙස පොළොව සිප ගන්නා දිනයක් විය. කාෂ්ටක සූර්යයා මුළු පොළෝතලයම ගිනි මෙන් දවන්නා දිනයක් විය. මා එම මොහොතේ මාගේ යහනේ සැතපී සිටියෙමි. ටික වේලාවකින් හොරගාන හඬක් මාගේ කාමරයේ කවුලුවකින් මට ඇසිනි. මා එදෙස කන් යොමුකලේ ඉතාමත් ඕනෑකමිනි. එම ශබ්දය කෙතරම් යැයි කිවහොත් මුළු පොළොතලයම කම්පාකරන හඬක් විය. "දෙවියනි...... දෙවියනී......" මෙලෙස වර ගණන් එම ශබ්දය මට ඇසිනි. ටික වේලාවකින් මොරගාන පුද්ගලයා කාවද සොයන්නා වාගේ මට දැනිනි. එවිට මම තව තවත් එම ශබ්දයට සංවේදී වීමට උත්සහ ගන්නා ලදී.

*"...... දෙවියනි, දෙවියනි,....... ඔබ කොහෙද.......,"*

එය ඉතාමත් අසරණ කටහඬකි. එය කෙතරම් අගනෙද , කිවහොත් එය මිය යාමට ඉතා ළංව මිනිසෙකුගේ කට හඬකි. එයින් නොනැවතුන මා එම පුද්ගලයා සෙවීමට තැත්කළෙමි. ගිනි ගාන හිරු රශ්මිය මධ්‍යයේ සෙමින් ඉදිරියට පියමැන්න මා දුටුවේ ලෙයින් පෙඟී ගිය වස්ත්‍රයකි. මම තවත් ඉදිරියට ඇවිඳගෙන ගියෙමි. එවිට මා දුටුවේ පුදුම සහගත සිද්ධියකි. විශාල මිනී මැරීම් වලට , නීතියට අසු වූ බර පතල සොරුන් දෙන්නෙක් මධ්‍යයේ කුරුසයේ ඇණ ගැසූ ඉතාමත් අහිංසක මිනිසෙකි. මුහුණ විකෘති වී තිබීම, මුළු ශරීරය පුරා වන කැළැල් දුස් ගණන් සහිත වීම එම පුද්ගලයගේ ලක්ෂණයි. ටික වේලාවකින් එම පුද්ගලයා නැවත මුමුණන්නට පටන්න්නා ලදී, මමද එයට ඉතා ඕනෑ කමින් සවන් දුණෙමි.

*" දෙවියනි, දෙවියනි,....... ඔබ මා අත්හැරියේ මන්ද? ....."*

එය ඉතාමත් බයාදු හඬකි. ඔහුගේ මුහුණද ලෙයින් පෙඟී තිබු ආකාරය බොහෝ දෙනෙකුගේ පයට පෑගුණු රතු රෝස මලක් බඳු විය. එම පුද්ගලයා දෙවියන්ගේ පුත්‍රයාණන් බවට සනාථ කරමින් ඒ මහා අවසන් හුස්ම වායුගෝලයට නිදහස් කරමින් කුරුස ගසේදීම එල්ලා තිබියදී මිය ගියේය. ලෝකයේ අසාධාරණය වෙනුවෙන් මිය ගිය තවත් මිනිසෙකු යැයි මා හට සිතිනි. ටික මොහොතකින් පසුව මහා ධාරාණිපාත වර්ෂාවක් ඇද හැලෙන්නට විය. එවිට කුරුසිය පාමුල සිටි සියල්ලන් සීසිකඩ විසිර යන්නට විය. නමුත් එක් කාන්තාවක් කුරුසිය පාමුල තනිවී සිටියාය. ඇයගේ කඳුළු වර්ෂාව සමඟ සෙමෙන් ගලාගියේය. වැසි දිය කෙමෙන් ඇයගේ නෙත් දිය බවට පත් වුවාය. ඒ මහා ශ්‍රේෂ්ඨයාණන් මෙලොවින් තුරන් වී ගොස් ඇත. නමුත් ඔහුව දෙවියන් අත්නොහරින බව මට සිතිනි. එනමුදු ඔහු නැවත දින කිහිපයකින් මරණයෙන් නැගිටින බව මම දනිමි.

එසේනම් හැරෙමු අප දෙසට මේ නිශ්ඵල ලෝකයේ නිශ්ඵල ලෙස ජීවත්වන්නන්, මුදල් පසුපස පමණක් ජීවිතය සොයන්නන් දෙස සිතමු. ඔවුන් දෙවියන් අතහැර ඔවුන් ජීවිතය නම් වු ධාවන පථයෙහි ඉතා වේගයෙන් දිව යයි. නමුත් ඔවුන්ගේ වේගය අධික වූ විට ඔවුන් ඇද වැටෙයි. එවිට ඔවුන්ව දෙවියන් අත හරින ලද අය ලෙස සිතයි. නමුත් ඔවුන් දෙවියන් වහන්සේ අතහැර නැත.

**හංසික මල්ෂාන් ජයකොඩි**
2014 (අ.පො.ස /සා.පෙළ)
මග්දලා දහම් පාසල - දුංගල්පිටිය (කැපුන්ගොඩ මීසම)

# අනෙකා ගැන සංවේදී නොවීම දඬුවම් ලැබිය යුතු වරදක්ද?

**ආදර දුවේ පුතේ මේ අහන්න....**

මේ දිනවල අප තවත් චතාරිකයක් පසුකරගෙන යනවා. දේව දරුවන් වන අප හැමෝම අපේ අඩුපාඩුනම් වලින් එතෙර වෙමින් නව පාස්කුවක් අත්දකින්නට සාන්ත සභා මාතාව අපට ආරාධනා කරනවා. ඒ සඳහා ජේසු සමිඳාණන් අපට ඉගැන්වූ තවත් උපමාවක් විමසා බලමු. ඒ ධනවතා සහ ලාසරස්ගේ උපමාවයි. (ලුක් 16/19-31)

ජේසු සමිඳුන් පෙන්වනා පරිදි ධනවතාගේ නිවස ඉදිරිපිට ඉඳගෙන සිටි දුප්පත් ලාසරස්ට මේ ධනවතා බැන්නේ නෑ, ගැහැව්වෙත්, එලෙව්වෙත්, හිරිහැර කළේත් නෑ. දෙදෙනා ගේම මරණින් පසු ධනවතා නිරයටත් , ලාසරස් ස්වර්ගයත් ගියා. එහෙම නම් අපි බලමු ධනවතා කළ වරද කුමක්ද කියා. ඔහු තමාගේ නිවස ඉදිරිපිට සිටි, දුගියා ගැන තැකීමක් සැලකිල්ලක් දැක්වුයේ නෑ. අන්න ඒකයි වරද, ඒ අතපසු කිරීමේ ගැන්මක් නැතිව සිටීමේ වරදයි.

අපි අතිනුත් මෙවැනි වැරදි රාශියක් වෙනවා. නො දැනුවත්වම අපි දැන් නිවසින් පටන් ගනිමු. ඔබේ අම්මා තාත්තා වෙහෙස මහන්සි වී ගෙදරට ගොඩ වෙද්දි සිනා මුසු මුහුණින්, සෙනෙහෙබර ආමන්ත්‍රණයකින් ඔබ ඒ අයව පිළිගත්තොත් නිවසේ සිටින සහෝදර සහෝදරියන් හා සැම දෙනාගේ සුළු සුළු අවශ්‍යතාවයන්ට සංවේදී වුවොත් කොයි තරම් හොඳද? තනිවෙලා ඉන්න ලෙඩ වූ හෝ වයස්ගත වූ හෝ අයට කාරුණික වචනයක් හෝ පොඩි උදව්වක් කළොත්, ඒ අයගේ මුණ බලා කාරුණික ලෙස කතා කළොත් දුක සැප විමසතොත් ඒ අයගේ ජීවිත සතුටින් පිරේවි. පුංචි ඔබ නිසා මෙලෙසින් ඔබේ ගෙදරින් පටන් ගෙන පංති කාමරයට , පාසලට ගමට, දේශයට දේව ආදරය ගෙන යන පුංචි ජේසු කෙනෙක් වෙන්න ඔබට පුළුවන්. අප ගැලවුම්කාර ජේසු සමිඳුන් දේව තාත්තාගේ ආදරය ලොවට පෙන්වුවේ එහෙමයි. එමනිසා අපි අප අවට සිටිනා, සෑම දෙනා ගැනම සංවේදී හදවතක් ඇති කර ගනිමු. ඒ කියන කරන, බලන, සැම ආකාරයක්ම ආදරයෙන්ම කරමු. අන්න එවිටයි ඔබේ දේව දරුකම සම්පූර්ණ වන්නේ ඔබ ලෝකයට ආලෝකයක් වන්නේ.

**විනිග්‍රිඩා රණසිංහ ගුරු මව - මීගමුව**

# පාස්කුව



ජේසුස් වහන්සේ මානව සංහතියට විමුක්තිය උදා කර දෙනු සඳහා මිනිස් කයක් ගෙන, මිනිසකුට විඳය නොහැකි තරමේ දුක් කන්දරාවක් වින්ද සේක. එහෙත් උන්වහන්සේ අත අබමල් රොනක තරම් වරදක් , පාප කිළුටක් නොතිබුණී

එසේ නම් දුවේ පුතේ, උන්වහන්සේ එතරම් දුක් කන්දරාවක් වින්දේ ඇයි? එදා මෙදා තුර ඔබ අප සැමගේ පාප වලට වන්දි ගෙවීම සඳහාය. දෙවි පියාණන් වහන්සේ ගේ කැමැත්ත වුයේ එයයි. "මංශගත වූ දේව වචනය" ලෙසින් සැලකෙන ජේසු සමිඳාණන් සැබෑ මිනිසකු වූ බැවින් උන්වහන්සේට ගැසූ සෑම කස පහරක්ම තදබල වේදනා දෙන්නේ විය. උන්වහන්සේට එල්ල කරන ලද සෑම හෙල්ල පහරක්ම ම වේදනා බර විය. කටු ඔටුන්නක් හිසට තබා එහි කටු තදවනසේ දුන් පහර නිසා ඉවසිය නොහැකි වේදනාවක් දැනෙන්ට වූණි.

ආදර දුවේ, පුතේ, මේ අධික තර වද වේදනා වලට ඔබ අප යම් පමණකින් හෝ දයක වනවාට සැකයක් නැත. චතාරික දින 40 පුරා අපි මේවා සිහිපත් කළෙමු පාදනමස්කාර පිළිවෙතෙහි යෙදුනෙමු. ශු. පැය කළෙමු. එක්වරු ශීලය රැක්කෙමු. මර්ධන ක්‍රියා කළෙමු.

ඒවා ඉතා හොඳ වත් පිළිවෙත්ය. ඊටත් වඩාත් වැදගත් වන්නේ ජීවිතයේ තිබුණු අඩුපාඩු, සුළු සුළු වැරදි දෝෂ අවම කරගැනීමට ගත් තීන්දු තීරණයි. දැන් එළඹ ඇත්තේ පාස්කුවයි. එය පාප අඳුරෙන් ජීවනයට එතෙර වීමේ අවස්ථාවයි. ඒ අප පවින් මුදා ගැනීම සඳහා විජයග්‍රාහී උත්ථානය එයින් සිහිපත් කරන බැවිනි. ඔබ ගත තීන්දු තීරණ පාස්කුවක් සමග අමතක කර දැමිය හැකි නොවේ. අප මිනිසුන් වශයෙන් දුර්වල බව සත්‍යයකි. එහෙත් ජීවිතය විචිත්‍රවත් කර ගැනීමට අප ගත් තීරණ ක්‍රියාවට නැංවීම සඳහා අප ගන්නා ප්‍රයත්නයන් ජේසු සමිඳාණන් අගය කරනු නොඅනුමානය.

පිවිතුරු ළමා විය වඩාත් පිවිතුරු කර ගැනීමට මෙම පාස්කුවේදී හිතට ගනිමු. එවිට,'පාස්කුවේ අසිරිය" අත්දකින්නට ළමා ඔබට අවස්ථාව උදාවෙනවා නොඅනුමානයි.

**සී.ආර්. ඩික්සන් ඇන්ටනි මාමා**

# පාස්කු න

***ශ්‍රී ලංකාවේ ප්‍රථම ශුද්ධවරයාණන් හා ආසියාතික අ***
***විරුදාවලියෙන් පිදෙන ශු. ජුසේවාස් මුනිදුන් ශුද්ධව***
***එතුමාණන්ගේ පියසටහන් මෙන්ම එතු***
***අද්විතීය ධර්මදූතික ක්‍රියාදමයන් පිළිබඳව අධ***
***ඒ තුළින් අපගේ දුතිකමෙහෙවර වඩාත් පුළුල් කරමින්***
***මේ ඓතිහාසික දයාද රුකුලක් වනු ඇතැයි බල***

***දේවජනතාවගේ භක්ති අභ්‍යාස අතුරින් පාස්කු***
***සුවිශේෂී ස්ථානයකි. මධ්‍යතන යුගයේ ප්‍රංශය එංගලන්***
***වලින් ආරම්භ වූ මෙම භක්ති අභ්‍යාස පසුකාලීනව පෙ***
***සපැමිණි ධර්මදූතවරුන්ගේ ධර්මදානීය මෙහෙවරේ සුවි***
***හැකිය. මේ අනුව ඉන්දියාවේ ගෝවා ප්‍රදේශය, පිලිපීනය***
***වැනි රටවල නත්තල්, පාස්කු හා සුවිශේෂි මංගල්‍යයන්***
***ධර්මදානය ලබා දෙන ලදි. පෙරදිග රටවල් අතුරින් ඉන්දි***
***සුවිශේෂි ස්ථානයකි. මේ සඳහා විශාල පිටුවහලක් වූ ආයත***
***පුර ජේසු නිකායික සා. පාවුළු විද්‍යායතනය නම් කළ හැකිය.***
***පදනමක් ඔස්සේ චතාරික අභ්‍යාසයන් වන පාස්කු නාට්‍යය***
***උදෙසා සවිමත් පදනමක් වැටුනි. පාස්කු නාට්‍ය කලාව හ***
***ප්‍රදේශය ඔස්සේ අප දේශයට සංක්‍රමණය වූ උප සංස්කෘති***
***හැකිය. එහි මූලාරම්භය ලෙස ස්පාඤ්ඤයේ වීදිසංචා***
***"ඕටෝස්" නම් කෙටි නාට්‍යය භක්ති අභ්‍යාසය***
***පසුව ස්පාඤ්ඤයේද, පෘතුගාලය ද, පෘතුගාලයෙන***
***ගෝවෙන් එය ආසියානු සංස්කෘතින්ට ඔබින ලෙ***

## මුලාරම්භය

පෘතුගීසි සමයේ දී මෙරට පළමු කිතුනු නාට්‍ය රග දක්වා ඇත්තේ ක්‍රි.ව. 1602 දී කොළඹ අනුනායක දෙව්මැඳුර ආසිරි ගැන්වූ විටදීය. පසුව ක්‍රි.ව. 1615 දී කම්මල දෙව්මැදුරේ ආසිරි ගැන්වූ විටදීය. පසුව ක්‍රි.ව. 1615 දී කම්මල දෙව්මැඳුරේ මංගල්‍යය දින ලෝකය මැවීමද ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගතවීමේ සිදුවීමද රඟ දක්වා ඇත. තවද ක්‍රි.ව. 1617 දී හලාවත කොන්ස්තන්තීනු අගරප්ජුගේ සිත් හැරීමද ක්‍රි.ව. 1627 මාතර දී ශු. ස්නාවක ජුවාම් මුනි චරිතය ඇසුරින් වාසප්පුවද රඟ දක්වා ඇත. මෙකල ප්‍රැන්සිස්කාන වාර්තාවනට අනුව මහා පාද නමස්කාරයක් 16 වන සියවසේදී මෙරට සිදුකර ඇත. දැඩි පශ්චාත්තාපී ක්‍රියාකරමින් යාච්ඤාවෙන් හා භාවනාවෙන් ජේසු සමිඳුන්ගේ ජීවමාන ප්‍රමාණයේ ප්‍රථිමාවක් රැගෙන දුක්ප්‍රාප්ති ගීතිකා හෙවත් පසම් ගී ගයමින් ගමන් කළ බව සඳහන් වේ. පෙර කී ප්‍රථිමාව මෙරටට ගෝවෙන් රැගෙන ආ බවත් එමගින් මෙරට පාස්කු නාට්‍ය ප්‍රථමයෙන් සිදුවූ බවත් පිළිගැනේ.

## ප්‍රතිමා පාස්කුව



මෙරට ප්‍රථිමා මගින් පාස්කු රඟ දැක්වීම බෙහෙවින්ම ව්‍යාප්ත වුයේ ඕලන්ද පීඩන යුගයේදීය. ඒ සඳහා ගෝවේ ශාන්ත පාවුළු විදුහල මහඟු පිටුවහලක් විය. මේ විද්‍යායතනයේ අධ්‍යාපනය හැදෑරූ ශු. ජුසේවාස් මුනිඳුන්ගේ හා අතිපූජ්‍ය ජාකොම් ගොන්සාල්වෙස් පියතුමන්ගේ සුවිශේෂි දායකත්ව යෙන් මෙම ප්‍රථිමා පාස්කු මෙරට තුළ ව්‍යාප්ත විය. ඒ ක්‍රි.ව. 1705 සිටය. ක්‍රි.ව. 1705 දී වන්නියෙන් ආරම්භවූ පාස්කු නාට්‍ය සඳහා ප්‍රථිමාවන් ගෝවෙන් රැගෙන ආ බව සඳහන් වේ. එම ප්‍රථිමා අදත් මන්නාරමට නොදුරු පරපාන්කන්දල් දේවස්ථානයේ දක්නට ඇත. දැනට ලංකාවේ ඉපැරණිම පාස්කු වන්නියෙන් ආරම්භ වූ බව පිළිගැනේ. තවද වසර 300 ක කාලයක් පුරාවට ම සමිඳාණන්ගේ දූක්ප්‍රාප්තිය රඟදැක්වීම සඳහා ගෝවෙන් රැගෙන එන ද පාස්කු ප්‍රතිමා උපයෝගි කරගෙන, ප්‍රතිමා මඟින් සමිඳුණන්ගේ දුක්ප්‍රාප්තිය රඟදැක්වූ අතර එහි ශේෂයන් තවමත් දැකගත හැක. ඔරතෝරියාන වාර්තාවලට අනුව ප්‍රතිමා මඟින් පාස්කුව රඟ දැක්වීමේ මෙරට පළමු ස්ථානය වන්නේ ද මෙම දේවස්ථානය වේ. තවද මේ පාස්කු රඟදැක්වීම සඳහා තවමත් මේ දේවස්ථානය අනුබද්ධිත පරිවාරික දේවස්ථාන 15 පවතින එක් ප්‍රතිමාවක් හා භාණ්ඩ ශු. සතියේ පරපාන්කන්දල් දේවස්ථානයට රැගෙන එන අතර මහසිකුරාද මෙහෙයන් ආපසු මේ භාණ්ඩ හා ප්‍රතිමාවන් ආපසු ඒවා තිබු දේවස්ථානවලට ම රැගෙන යති.

මේ නිසා මෙම දේවස්ථානවල එක් ප්‍රතිමාවන් භාණ්ඩ හා කුරුසිය දක්නට ඇත. පරපාන්කන්දල් දෙවස්ථානයේ ස්ථාපිත දුක්ප්‍රාප්තියේ කිතු සමිඳාණන්ගේ ප්‍රතිමාව ක්‍රි.ව. 1860 දී ගෝවෙන් රැගෙන එන ලද්දකි. මෙය නිර්මාණ කර ඇත්තේ ගෝවේ ඩියෝමෝ කොස්තා නැමැති මූර්ති ශිල්පියා ය. මෙම පාස්කු දර්ශණය දක්වා භාවිතා කරන කුරුසිය 'චන්ඩියාකුලම් ශු. පේදුරු පාවුලු දේවස්ථානයේ'ස්ථාපිත ය. මේ නිසාම මේ යුග

# ාට්‍ය

ග්‍රගන්‍ය ධර්ම ධරයාණන් ලෙස
රයට නිමිති කොට ගෙන
මාණන්ගේ
ධ්‍යයනය කිරීම හා
සමිඳු කෙත අස්වදන්නට
පොරොත්තු වෙමි.

නාට්‍යය වලට හිමිවන්නේ
තය හා ජර්මනිය වැනි රට
ර්දිග හා අපරදිග රටවලට
ශේෂාංගයක් ලෙස නම් කළ
,ආජන්ටිනාව, සැල්වදෝරය
අරඹයා නාට්‍යානුසාරයෙන්
යාවේ ගෝවාපුරයට හිමිවූයේ
නයක් ලෙස ඉන්දියාවේ ගෝවේ
. මෙම ආයතනය තුළින් සව්මත්
න් පසම් හා ලතෝනි යනාදිය
පසම් හා ලතෝනි ද ගෝව
ක ලක්ෂණයක් ලෙස නම් කළ
රයේ කිරීමේදී රංගගත වූ
නම් කළ හැකිය.
ත් ඉන්දියාවේ ගෝවේද,
ලස ව්‍යාප්ත විය.




වලදි වන්නියේ, මහනුවර, කොට්ටියාර්, පුත්තලම හා බෝලවත්ත යන දේවස්ථාන වල ශු. සතිය පැවැත්වීමේදී මෙම ප්‍රතිමා පාස්කු රංග ගත විය. මෙහිදී ශු. ජුසේවාස් පියතුමා විසින් රචිත ''මහා පාද නමස්කාරය කෘතිය'' වනාහි එකල ගෝවේ පැවති පාද නමස්කාරය ඇසුරින් රචනා කරන ලද්දකි. ඔරතෝරියාන වාර්තාවන්ට අනුව ක්‍රි.ව 1705 දී මෙරට මුලින්ම පාස්කු රඟ දක්වා ඇත්තේ වන්නි ප්‍රදේශ වලය. මේ සඳහා රැගෙන එන ලද ප්‍රතිමාවන් ගෝවෙන් රැගෙන එන ලද ප්‍රතිමාවන් ගෝවෙන් රැගෙන ආ බව සඳහන් වේ. මෙහි විශේෂත්වය වුයේ මෙහි ප්‍රතිමාවන් ලීයෙන් නෙලා තිබූ අතර එහි හිස, පාද, දෙඅත් පමණක් තිබීමය. සෙසු කොටස් වලට මැද ලීයක් තබා පිදුරු පුළුන් යොදා ඇඳුම් ආයිත්තම් වලින් සරසා තබන ලදි. මුල් යුගයේ පැවති පාස්කු දර්ශන නිහඬව ක්‍රියාකරන ඒවා විය. ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා මේ නිහැඬියාව බිඳ හැරියේ දුක්ප්‍රාප්ති ප්‍රසංගය හෙවත් දේශනා නවයේ පසම් පොත තුළිනි. එමගින් මුළු දුක්ප්‍රාප්තිය සත්සතියකට බෙදා දේශනා 09 කට සකස් කොට ඉදිරිපත් කෙරුණු අතර මේ දේශනාවෙන් උස් හඬින් උච්චාරණය කරන විට ඒදිනට අදාල ජවනිකාව ප්‍රතිමාවන් මගින් (රූප විලාසය) වේදිකාවේ රංගගත කෙරිණි. මෙම දේශනාවෙන් බොහෝ විට උච්චාරණය කරන ලද්දේ පුජාප්‍රසාදිතුමකු විසිනි.

කල්යත්ම ලන්දේසි පීඩනය නිම වී බ්‍රිතාන්‍ය යුගය ආරම්භ වූ විට පාස්කු නාට්‍ය කලාව ඉතා සීඝ්‍රයෙන් මෙරට තුළ ව්‍යාප්ත වන්නට විය. විශේෂ යෙන් මුහුදුකරයේ හලාවත, මීගමුව ,පමුණුගම, පිටිපන, දූව ආදී ප්‍රදේශ වල සීඝ්‍රයෙන් වර්ධනය විය. දූවේ පාස්කු නාටක ඉතිහාසය වසර 400 කටත් වඩා පැරණිය. මේ පාස්කු සංදර්ශණය අති පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාගේ දුක්ප්‍රාප්තිය ප්‍රසංගය භාවිත කරමින් ප්‍රතිමා මගින් නිරූපනය විය. ක්‍රි.ව. 1838 මාර්තු 27 වන දින ඉන්දියාවේ කොචින්හි සිට දූවට රැගෙන ආ ක්‍රිස්තු ප්‍රතිමාව මේ පාස්කු නාට්‍යයේ කේන්ද්‍රස්ථානය විය. මේ ප්‍රතිමාව කොචින්හි ශ්‍රේෂ්ඨ ප්‍රතිමා ශිල්පියෙකු වූ ජෝකිනු මෙස්ත්‍රිගේ නිර්මාණයකි. එතැන් සිට අද දක්වාම ලෝකයේ ප්‍රකට පාස්කු නාට්‍යයන් අතරින් දූව පාස්කු දර්ශණය දෙවැනි ස්ථානය ලබා ඇත. පල්ලන්සේන දේවස්ථානයේ දැනට තිබෙන ප්‍රතිමාවන් තුන ක්‍රි.ව 1847 දී ඉන්දියාවේ සිට පැමිණි ශිල්පියෙකු විසින් නෙළන ලද කිතු සමිඳුන් ගල් කණුවේ බිඳින ලද ප්‍රතිමාව උකුත් වූ ප්‍රතිමාව හා උත්ථාන වීමේ ප්‍රතිමාව නිරූපනය කොට පාස්කු සංදර්ශණ එහිදී ආරම්භ විය. මෙහිදී කිතු සමිඳුන් මරියතුමිය ජුවාම් ගෝලයා හා මරිය මදලේනා යන චරිත වලට සුරුවම් භාවිත කර ඒවාට ඇඳුම් අන්දවා රූකඩ අනුසාරයෙන් රඟ දක්වනු ලැබීය. කළමුල්ලේද ක්‍රි. ව 1844 දී ගෝවෙන් රැගෙන ආ ප්‍රතිමාවන් නිසා එහි පාස්කු සංදර්ශන සුප්‍රකට විය. ක්‍රි.ව 1885 දී මෝදර සා. ජෝන් දේවස්ථානය ආශ්‍රිතව ප්‍රතිමා නිරූපනය කරමින් ප්‍රතිමා පාස්කුවක් ඇරඹූ ලංකාවේ අලංකෘතම ජේසු සමිඳුන්ගේ යාගික ප්‍රතිමාව ඔවුන් සතු වීම සුවිශේෂී වේ.

**අසේල දසනායක**

# ආලෝකයාණෝ

**කෝට්ටේ මීසමේ ගොඩ ඉරුදින රඟ දැක්වෙන පාස්කු නාට්‍ය නිමිත්තෙනි**



නාසරතෙහි ජේසුස් වහන්සේ පියාණන් වහන්සේගෙන් ජනිත වන දේව පුත්‍රයාණන්ය. දේව පුත්‍රයා තම දේවත්වය පසෙකලා, අප උන්වහන්සේ හා සමාන වන පිණිස උන්වහන්සේ අප හා සමාන මිනිස් බව ගෙන මෙලොවට වැඩම කර අප අතර වාසය කළ සේක. අතිවිශිෂ්ට "මාංශගත වීමේ අභිරහස" එයයි. ඔවුන් වහන්සේ මෙලොවට පැමිණියේ මුළු මනුෂ්‍ය වර්ගයාටම ගැළවීම ලබා දීමටය.

ජේසුස් වහන්සේ මෙලොව ජීවත් වූ කාලයේදී දෙවිපියාණන්ට අවනතව දේව කැමැත්ත ඉටු කරමින් දේව පණිවුඩය ජනතාවට දේශනා කළ සේක. එම සියලු දේශනාවල කේන්ද්‍රය වූයේ දේව රාජ්‍යයයි. තවද ඔවුන් වහන්සේ වහලුන්ව මිදීම දානය කළ සේක. අන්ධයින්ට පෙනීම ලබා දුන් සේක. පීඩිත වූවන් මුදවා ගත් සේක. රෝගීන්ට සුවය දානය කළ සේක. සියලු ජාතීන්ට එතුමාණෝ යුක්තිය ගෙන දුන් සේක.

ආරම්භයේදී උන්වහන්සේගේ දේශනා වලට බොහෝ දෙනෙක් ඇදී ආවත්, ව්‍යවස්ථාව, දේව මාලිගාව හා දෙවියන් වහන්සේ පිළිබඳව ඔවුන් වහන්සේ දැක්වූ ආකල්ප නිසා ඊශ්‍රායෙල් ආගමික නායකයෝ එතුමාණන් සමඟ උරණ වූහ. පව්කාරයින් කෙරෙහි දැක්වූ අනුකම්පාව දෙවියන් වහන්සේ පව්කාරයන් කෙරෙහි දැක්වූ අනුකම්පාවට සමාන බව කීම ඔවුහු නොපිළිගත්හ. ලූක් සුවිශේෂයේ 15 වන පරිච්ඡේදයේ දැක්වෙන නැති වූ පුත්‍රයා, නැති වූ කාසිය, නැතිවූ බැටළුවා යන උපමා මේ සඳහා කදිම නිදසුන්ය. ජේසුස් වහන්සේ පියාණන් වහන්සේ සමඟ එක්කෙනෙකු බව කීම ඔවුන්ට දැරිය නොහැකි විය. ඒ නිසා ඔවුන් උන්වහන්සේව නඩු තීන්දුව සඳහා පිලාත් වෙතට ගෙනාවෝය.

පිලාත් විසින් ජේසුස් වහන්සේ මරණීය දණ්ඩණයට පත් කිරීම සඳහා, ඔවුන් වහන්සේ අතින් කිසිදු අපරාධයක් සිදු නොවී ඇති බව පැවසුවද බරබ්බාස්ව නිදහස් කර ඔවුන් වහන්සේව කුරුසියෙහි ඇණ ගසා මරා දමන්න යැයි ඉල්ලමින් ජනතාව වැඩි වැඩියෙන් මොර ගැසූහ. පිලාත් ද ඔවුන්ගේ ඉල්ලීම පරිදි තීන්දුව දුන්නෝය. ජේසුස් වහන්සේට තමන්ගේම හස්ත වලින් සුව කෙරූ, දහම් පණිවිඩය දෙසූ මේ මිනිසුන් තමන් වහන්සේව මෙලෙස මරණයට පත් කිරීමට සූදානම්ව සිටිනු දැක කොපමණ දුකක් හා වේදනාවක් දැනෙන්නට ඇත්ද? එහෙත් එතුමාණෝ නිහඬව සිටි සේක. උන්වහන්සේ මරණය, එනම් කුරුසියේ මරණය දක්වාම පහත්වී කීකරු වූ සේක. උන් වහන්සේව කුරුසියේ ඇණ ගැසූ මොහොතේ "පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව, ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති" යැයි ජේසුස් වහන්සේ වදාළේ මොවුන්ගේ පාප වලට සමාව ද ලබා දීමටය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තියට හා දුක්ඛිත මරණයට වගකිය යුත්තේ ජුදා ජාතිය පමණක් නොව මුළු පව්කාර ලෝකකයි.

ක්‍රිස්තුන් වහන්සේ අපට ප්‍රේම කොට මුළු මනුෂ්‍ය සංහතියේ විමුක්තිය පතා ජේසුස් වහන්සේ තම ජීවිතය මිහිරි සුගන්ධ පූජාවක්ද යාගයක්ද හැටියට අප වෙනුවෙන් දෙවියන් වහන්සේට පරිත්‍යාග කළ සේක. එය මිනිස් සංහතියේ පාපයේ විපාකය තම කරට ගැනීමකි. ගල්ලනෙ ළඟ සිටි දේව දූතයාගේ වචනය වූයේ "ඔවුන් වහන්සේ උත්ථානය වූ සේක" (මාක් 16:6). මනුෂ්‍ය ඉතිහාසයේ කිසි විටෙකත් සිදු නොවූ සිද්ධියක් ගැන මේ වාක්‍යයෙන් කියවේ. ඔවුන් වහන්සේ ලාසරස් හා නායිම් නුවර වැන්දඹුවගේ පුත්‍රයා උත්ථානය කරනු ලැබුවද ඔවුහු නැවත මරණයට පත් වූහ. ඔවුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වීම සම්පූර්ණ අලුත් සිද්ධියකි. එය මරණයෙන් ආපසු පැමිණීමක් නොව මරණය අභිබවා ගොස් ජයග්‍රහණය කිරීමකි. අලුත් පැවැත්මකට මුල පිරීමකි.

පාස්කු අභිරහස තුළින් අන්ධකාරයේ පාලනය මුළුමනින්ම පරාජය කරමින්, මුළු මනුෂ්‍ය සංහතියට විමුක්තියේ ආලෝකය උදා වීය. එමගින් අපගේ එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න ගැටලු වලට ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය පිළිතුර ලබා දී ඇති. ජේසුස් වහන්සේගේ දුක් විඳීමට, මරණයට හා උත්ථානයට සහභාගී වන සෑම කෙනෙකුටම මෙලොව මරණය අවසානයක් නොවේ. නව ජීවිතයකට ආරම්භයකි. සදාතනික ජීවිතයට දොරටුවකි.

ක්‍රිස්තු ධර්මය ගොඩනැගී ඇත්තේ මිය ගිය උදාර පුද්ගලයෙකුගේ සොහොනක් මත නොව මරණය මරා උත්ථානය වු ලෝකයේ ආලෝකය වන ක්‍රිස්තුන් වහන්සේ මතය. දේව ආත්මයාණන් තුළ ප්‍රීතියෙන් පිරි නිත්‍ය වූ ලොව අත්දැකීම හැක්කේ විශ්වාසයේ ආලෝකයෙන් පමණි. එසේ නම්, මෙවර පාස්කුවේදී මනස්ථාප වී පව් සමාව හා සිත් සාමය ලබා නැවතත් දෙවිඳුන් වෙතට හැරී ඒමට අපි අදිටන් කර ගනිමු.

ජීවමාන කිතු සමිඳුන්ව ඇසුරු කර ඔවුන් වහන්සේ හා හෘදයාංගම සම්බන්ධතායක් ඇති කරගත්හ. ඒ සබඳතාවය ගැඹුරු කරගන්නා තරමට අපි සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකයෝ වෙමු. සැබෑ දෙවියන් මෙන්ව සැබෑ මනුෂ්‍යාද වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේය. එබැවින් සියලු මනුෂ්‍යයෝ උතුම් බව සලකා, ඔවුන්ට ගරු කරමින් හා ප්‍රේම කරමින්, ආගම් කුල ජාතී භේද නොතකා සියලු දෙනාම එක හා සමාන ලෙස සලකමින්, සාමයෙන් හා සහෝදරත්වයෙන් ජීවත් වී සියලුම මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් මනුෂ්‍යයන් ලෙස කටයුතු කරමු. ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන ශරීරය වන දිව්‍ය සත්ප්‍රසාදයෙන් පෝෂණය ලබමින් අපි නිත්‍ය මහිමයට ළඟා වෙමු. මෙලෙස අප පාස්කු අභිරහසට සහභාගී වන තරමට අප දේශය හා ලෝකය සුවපත් වනු ඇත.

**මරියා ක්‍රිස්ටීනා ප්‍රනාන්දු**
කෝට්ටේ, ශා. තෝමස් දහම් පාසලේ
ආදී ශිෂ්‍යාවකි.

# ජීවිතයම පාදනමස්කාරයකි.



ජීවිතය යනු ඉතා අසීරු , කටුක අත්දැකීම් සහිත දුෂ්කරතා මධ්‍යයේ යන ගමන් මඟකි. රුදුරු වනාන්තරයක් පිළිබඳව මෙනෙහිකර බැලුවොත් එහි කටුක බව ඔබට හැඟේවී. ජීවිත ගමනත් එසේමය. කොතෙක් දුෂ්කරතා මධ්‍යයේ වුවද මේ ජීවිත ගමනේ අප ජීවත්විය යුතුය.

අපගේ පාපයන්ට වන්දි වශයෙන් දෙව් පුතුණුවන් අප නිසා යාග වීමට කල්වාරිය වෙත පියනැගීමට යන්නාවු ගමන් මග පාදනමස්කාරයයි. එහි ගමන් මග ඉතාමත් දුෂ්කරය. ඔවුන් වහන්සේව මරණයට තීන්දු කළ මොහොතේ දැනුනාවු මහත් බිය කෙතරම්ද, කීවොත් එතුමන්ගේ සිරුරේ දහඩිය රුධිරය මෙන් පිටවුවා. එතුමන් එදා මුහුණ දුන් අවස්ථාව ගැන ඔබ තනිව මෙනෙහිකර තිබෙනවාද ? එසේ නොවේනම්, දැන්වත් මේ මොහොතේවත් ඒ ගැන ගැඹුරින් මෙනෙහි කරන්න. ජේසුගේ මව වු මරියාවන් තම එකම පුතු වූ ජේසුස් වහන්සේව මෙසේ යාගවන බව දැනුනු මොහොතේ කෙතරම් වේදනාවක් ඇගේ සිත පාරන්නට ඇතිද? මේ තරම් කඳුලක් ඇගේ නෙත් දෙකෙන් කෙසේ දරාගන්ද? අපගේ ජීවිතය යන පාදනමස්කාරයේදී මෙවැනිනකට මුහුණ දීමට සිදුවුවහොත් අපගේ සිතට එවන් වේදනාවක් දරාගත හැකිද? එවන් දුක්ඛිත මොහොතක මෙවන් දුකක් දරා සිත යටින් විඳගනිමින් තම පුතු සමග සැමවිටම සිටි මරිමවුන් ආදර්ශයට ගෙන කටයුතු කිරීම මෙම ජීවිත පාදනමස්කාරයේ නොවැටී ගමන් කිරීමට එය ඉතා පැහැදිලි මං පෙත් විවරණයකි. ජේසු සමිඳුන් අප නිසා අපගේ පව් නිසා මෙවන් දුක්පීඩා විඳගත්තා සේ අපද ජීවිත ගමනට මෙය රුකුලක් කරගනිමු. පාද නමස්කාරය තුලදීද සාතන් අප වරදට පෙළඹවීමට විශාල වෙහෙසක් දරනා බවට කිසිදු සැකයක් නැති බව අපදනී. මෙතරම් සෙනෙහෙබර ශුද්ධවන්ත පියාණන්ව පවා වරදට පෙළඹවීමට උත්සාහ දැරූ සාතන් අපට ගිලිහී යාමට ඉඩ නොහරින බව අපට පසක් වී හමාරය. මෙවනි කටුක අත්දැකීම් හරහා ජීවිතය යන මාවතේ පියවරෙන් පියවර ඉදිරියට තබන අපගේ එකම පිළිසරණය දෙව් සමිඳුන් අතර ඇතිකර ගන්නා දැඩි සබඳතාව නොහොත් යාච්ඤාවයි. එය අපගේ එකම පිළිසරණයි. මෙම කරුණු ගැන ඔබ මදක් තනිව දෙවියන් තුළ විශ්වාසයේ සිහිපත් කර බැලීම තුළින් සිතට පූර් සුවයක් සහ සේ ජීවිත පාදනමස්කාරයේදී එම ගමන් මගට මුහුණ දීමට සිත් ධෛර්යය ඇතවනු නොඅනුමානය.

විහඟනා පෙරේරා
11 ශ්‍රේණිය
ශ්‍රී හෘදයේ දහම් පාසල - කටුගස්තොට

# දෙව් මවගේ සැඟවුණු කඳුළු



පුෂ්ප උයනේ යැදුම් ගතවී
සිටිනවිට සොල්දාදුවන් විත්
රැගෙන ගිය බව අසනු ලැබුණා
නොකළ දේකට ඔබව හසුකොට
දැත් සෝදා ගත් පුවත දැක
මගේ ළය පුත කිරි ගැසුණා
කුඩා කල සිට ස්නේහයෙන් වැදු
ඔබේ සිරුරට කස තලද්දි
පුතුනි මාගේ ළයට වැදුණා
බරවු කුරුසිය කරට දෙද්දි
එහිවු බර පුත මටද දැණුනා
ඔබට කරනා නිගරු සැම දැක
නිහඬවම මා දෙනෙත තෙමුණා
ලොවක් සනසා දහම ලැබදුන්
ඔබව හොරෙකියි නිගරු කරලා
කුරුසියේ ඇණගසනු ලැබුවා
පුතුනි ඒ ඇණ ඔබට මෙන්
මා හදවතට විත් තදින් වැදුණා
මගේ කඳුළින් ගොල්ගොතාවේ
ඔබේ ලේ බිඳු සේදී වැටුණා
පුතුනි එනුමැන නැවත කෙදිනක
විරාමෙන් පසු නපුර පරද
එතෙක් මා මෙහි කුරුස පාමුල
සිටිමි ලෝ සැම කඳුළ උදෙසා

**එවාන් ප්‍රනාන්දු**
11 ශ්‍රේණිය
**ලූර්දු මාතා දහම් පාසල - කිඹුලාපිටිය**

# උත්ථානයේ විජයග්‍රහනය



පාස්කුව නව මැවිල්ලේ මංගලයයයි. නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා විජයග්‍රාහී උත්ථානය තුළින් සකල මැවිල්ල අලුත් කළ සේක. පරිපූර්ණ කළ සේක. ප්‍රබෝධමත් කළ සේක. කතෝලික ධර්මයේ මුලික පදනම ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයයි. සාන්ත සභාව ආරම්භ වී ගොඩනැගුණේ ශු. පේදුරු හා පාවුළු ප්‍රමුඛ අපෝස්තුළුවරු ලෝකයේ සීමාන්තයන් දක්වා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ සුබාරංචිය රැගෙන යාම නිසාය. ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන නොවූ සේක් නම් අපගේ ඇදහිල්ල නිරර්ථක බව ශු. පාවුළු තුමා පවසන්නේ එබැවිනි.

මරණය නමැති අවසාන සතුරාත් පරාජය කර උත්ථාන වූ ජේසුස් ස්වාමින් වහන්සේ අපට නව බලාපොරොත්තුවක් දුන් සේක. ඒ මරණින් මතු ජීවිතය හෙවත් නව ස්වර්ගීය ජෙරුසලම පිළිබඳ අනාවරණයයි. පාපයේ විපාකය මරණයයි. එහෙත් දෙවියන් වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ සදාතන ජීවනයයි. (රෝම 6/23)

එබැවින් අපට බිය වීමට කරුණක් නැත. උන්වහන්සේ ආරම්භය සහ අවසානයයි. කාලය සහ යුගය සඳහටම උන්වහන්සේට අයිතිය. උන්වහන්සේ ඊයේත් , අදත්, හෙටත් අප සමඟය. දෙවිපියාණන් වහන්සේගේ ප්‍රේමයේ පරිපූර්ණ තම අනාවරණ උන්වහන්සේ යි. උන්වහන්සේගෙන් එහා යන ප්‍රාතිහාර්යයක් නැත. යුගයේ විශිෂ්ටතම ප්‍රාතිහාර්යය උන් වහන්සේය. පළමුවත් ජේසුස් වහන්සේය. දෙවනුවත්, ජේසුස් වහන්සේය. තෙවනුවත් ජේසුස් වහන්සේය. "ස්වාමිනි, අප කවරෙකු වෙතට යන්නද? සදාතන ජීවිතයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙතය." (ජුවාම් 6/68)

ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවිතය ආනන්ද ජනක අත්දැකීමකි. කතෝලික අපි උත්ථානයේ ජනතාවක් වෙමු. කොතෙකුත් දුක්පීඩා කරදර, වේදනා, තිබුණත් ඒ සියල්ල මැද සිනාසීමට කතෝලිකයාට හැකිය. ඒ මන්දයත් ක්‍රිස්තුන් වහන්සේ ඒ සියල්ල අභිබවා මහිමාන්විතව උත්ථාන වූ බැවිනි. එබැවින් ඔබේ වටිනා ජීවිතයේ අයිතිය උත්ථාන වූ කිතු සමිඳුන්ට බාර දෙන්න. සැබෑ වීරයා උන් වහන්සේයි. උන්වහන්සේ ඉතිහාසයේ එක්තරා යුගයක පහළ වූ ආගමික ශාස්තෘන් වහන්සේ කෙනෙකු පමණක් නොවේ. උන්වහන්සේ සදාකාලිකවම අප සමඟ ජීවත් වීමට පැමිණි සදාකාලිකයාණෝය. පාපයෙන් පිරි ලොව පවිත්‍ර කිරීමට පැමිණි පෙහෙළියාණෝය.

**දිනේෂ් පෙරේරා - දළුගම**

## ජේසුනි



දෙව්පුතු සතුටින් ලෙන ගිය කුරුසිය
ලේ පැල්ලම වැද රතු වු කුරුසිය
දෙව් සුසුමත් රැගෙනම ගිය කුරුසිය
දෙව් පුතු ඇණ ගැසු ඒ සුදු කුරුසිය

මව්නිගෙ දුක දුටු මහ බල කුරුසිය
මව් සෙනෙහේ රැඳී සුවඳයි කුරුසිය
පව් අපහට බර වැඩිමයි කුරුසිය
දෙව් පුතු කර ගිය ඒ රන් කුරුසිය

අප වෙනුවෙන් ඔහු ගෙනගිය කුරුසිය
අප පව් හැගෙනව දුටු විට කුරුසිය
වැටි වැටි ගෙන ගිය ඒ බල කුරුසිය
කඳු මුදුනකටම ගෙන ගිය කුරුසිය

නුඹ ගෙනයාවිද ලැබුනොත් කුරුසිය
මා ගෙනයාවිද ලැබුනොත් කුරුසිය
දෙව් පුතු වැටි වැටි ගෙන ගිය කුරුසිය
මහ බලයයි ඒ ශුද්ධ වූ කුරුසිය

**දිනිති වනිගසේකර - මීගමුව**

# "ශ්‍රී කුරුසිය"

විමුක්තියේ ලාංඡනය වන ශ්‍රී කුරුසිය වෙත කිතුනු ජනයාගෙන් සුවිශේෂී ගෞරවයක් හිමි වනු ඇත. මක්නිසාද ශුද්ධවූ සුවිශේෂයෙහි (1 කොරින්ති 1:18) සඳහන් ලෙස "කුරුසියේ පණිවුඩය විනාශ වන අයට විකාර දෙඩීමකි. එහෙත් විමුක්තියේ මගට පා තැබූ අයට එය දෙවියන් වහන්සේගේ බලය වන බැවිනි."

ක්‍රිස්තුන් වහන්සේ ජීවත් වූ සමය තුළ කුරුසිය උපකාර කරගනු ලැබුවේ, වංචාකාරයින් , මංකොල්ලකාරයින්, හොරුන්, මිනිමරුවන් වැනි අයහට දඬුවම් දී මරණයට පත්කිරීම පිණිසය. එබැවින් පුද්ගා සමය තුළ සැවොම පිළිකුලට ලක් කළ කුරුසියේ මරණය ක්‍රිස්තුන් වහන්සේ වෙත ලබාදීම සඳහා උන්වහන්සේගේ ඉගැන්වීම් ප්‍රතික්ෂේප කළ අය සැළසුම් කළේද ක්‍රිස්තුන් වහන්සේ වෙත නීච , නින්දා සහගත මරණයක් අත්කර දී ජේසුස් වහන්සේට ගැරහීම පිණිසමය.

එසේනමුදු ක්‍රිස්තුන් වහන්සේ ශ්‍රී කුරුසිය මත උකුත් වීමත් සමඟ බියජනක වූ මරණයේ සංකේතයවූ කුරුසිය වෙත නව අර්ථකථනයක් හිමි විය. එනම් ශ්‍රී කුරුසිය විමුක්තියේ හා ගැළවීමේ ලාංඡනය බවට පරිවර්තනය විය. එතැන්සිට කිතුනු ජීවිතයේ ඇරඹුම වන බෞතිස්ම ස්නාපනයේදීද එම දිවිය තුළ පවතින විශේෂ අවස්ථාවන් හීද, මෙන්ම මෙලොව ජීවිතයේ අවසානය වන මරණයේදීද ඔවුන්ව සළකුණු කරනු ලබන්නේ ශ්‍රී කුරුසියය. එබැවින් විමුක්තියේ ලාංඡනය වන ශ්‍රී කුරුසිය කිතුනු ජනතාව සමග බද්ධව ඇති බැවින් ශ්‍රී කුරුසිය කිතුනු බවේ සළකුණක් ලෙස සඳහන් කළ හැකිය.

ලොකේ රක්ෂණයෙහි මෝක්ෂ දෙරටු යතුරෙනී,
පාපේ ඖෂධයෙනි අප රකිනු ශ්‍රී කුරුසෙනී

(ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමන් විසින් රචිත "අසිරිමත් පුදබිම" කෘතියෙන් උපුටා ගන්නා ලද්දකි.)

**ආශා පෙරේරා - කෙරවලපිටිය**

# උත්ථානයේ විජයග්‍රහනය



එන්න මිනිසුනේ පිබිද
විමුක්තව සුවප්නයෙන්
ඔබ ජීවිතය දෙස
හදවත විවර කර බලනු මැන
අතීතය වර්තමානය
මිනිස් වෙස්ගත්
සිත් පිත් නැති මිනිසුනේ
අපචාර, අනාචාර
දුෂණය, භීෂනය
අයුක්තිය, අසාධාරණය
ලොවම වෙලාගෙන
මිනිසත්බව ඇත මිලිනව
මිනිසුන් උදෙසා
මිනිසත්බව ගත් දෙවිපුතුනී
ඔබ කුරුසියේ වැඟුරු ලෙයින්
මිනිස් අප පව් සොදා හැර
මිනිසත්බව යළි පුබුදන්නට
ඔබගේ උත්ථානයේ සත්‍යයේ
විජයග්‍රහනය අත්දකින්නට
ඔබ ගිය මග ඔස්සේ පියනගන්නට
වරදෙන්න සමිඳුනී, වර දෙන්න
මුළු මිනිස් සංහතියටම.....

**මාරි පැන්සි පෙරේරා - කලමුල්ල**

# මිතුරන් දෙදෙනා හා පාස්කු සූදානම




සඳුන් නගරයේ උසස් පාසලක අධ්‍යාපනය ලබන හයවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පුංචි සිසු දරුවෙකි. තුසිත රජයේ සාමන්‍ය පාසලක අධ්‍යාපනය ලබන සාමාන්‍ය පවුලක සිදු දරුවෙක් වුවත් තුසිත සඳුන්ගේ හොඳම මිතුරා වුණේ දෙදෙනාම නගරයේ එකම දහම් පාසලක ඉගෙන ගන්නා නිසාය. දහම් පාසල පටන් ගන්න පෙර දරුවන් තම තමන්ගේ කෑම බීම බෙදාගන්නා අතර සඳුන්, තුසිතලාගෙ ගෙදරින් ගෙනෙන ලැවරියා, හැලප, ඉදි ආප්ප කෑමට දක්වන්නේ ඉතා කැමැත්තකි. දිනක් තුසිත සඳුන් කෑම කන අවස්ථාවේ ''ඒක නෙමේ තුසිත ලබන ඉරිදා මං දහම් පාසල් එන්නේ නෑ....''

''ඇයි ඒ. ඔයාට පාද නමස්කාරයේ තුන්වන ස්ථානය කියවන්න තියෙනවා නේද?''

''ඔව් ඔව් මං තුන්වන ස්ථානයේ යාච්ඤාව බාර ගත්තා තමා හැබැයි මට දැන් හිතෙනවා බෑ කියලා.....''

''ඉතින් එහෙම කරන එක හොඳ නෑනේ''
''ඒ වුනත් මට බෑ ඔය යාච්ඤා හදන්න මහන්සි වෙන්න. අපේ අම්මා කිව්වා. මේ සැරේ පාස්කුවට හිනිදුම හරි කොහේහරි හොඳ තැනක පාද නමස්කාරයකට යනවා කියලා''

මේ විදිහට දෙන්නා කතා කර ඒ අයගේ අදහස් බෙදා හදාගෙන දහම් පාසලේ පාඩමට සහභාගිවුණා. සඳුන් තම ගුරුතුමියට පුංචි බොරුවක් ගොතා ''ටීචර් අපි ලබන ඉරිදා හිනිදුම යනවා ලබන සතියේ මට යාච්ඤාව කියන්න හම්බවෙන්නෙ නෑ,''කියා ඒ වගකීමෙන් බේරිලා ගෙදර ගියා. දහම් පාසලේ ගුරුතුමිය පාදනමස්කාරයේ තුන්වන ස්ථාන යාච්ඤාව කියවන්න තුසිතට දුන්නා. තුසිත සාමාන්‍යයෙන් ඉදිරියට ඇවිත් එවැනි දෙයක් කියවන්න අකමැති ළමයෙක් වුවත් ඒ වගකීම බාර ගත්තා. බොහොම අමාරුවෙන් ලොකු අයියාගේ ඇණුම් බැණුම් එක්ක පාදනමස්කාරය කියවන්න පුරුදුවෙලා ඉතා හොඳින් තුසිත ඒ යැදුම කියෙව්වා. ගුරුතුමිය ඔහු එය හොඳින් කළ නිසා ප්‍රශංසා කළා. පසු ඉරුදින ඉරිදා පුජාවෙන් පසු තම මිතුරා එනතුරු ඉදිආප්ප මුලත් තියාගෙන බලාගෙන හිටියා. තුසිතට හරිම දුකයි. බයකුත් දැනුනා යාළුවට කරදරයක්ද කියා. ටික වේලාවකින් සඳුන් නොන්ඩි ගසමින් පන්තියට ඇතුලු වුණා. එක කකුලක් වේලුම් පටිවලින් වෙලා බොහොම අමාරුවෙන් තමා පන්තියේ වාඩි වුණේ. දහම් පාසල නිම වුණා. තුසිත සඳුන් ළඟට දුවගෙන ආවා.

''ඔයා හිනිඳුම ගියාද? ''මොන හිනිදුමද? මං එදා බොරුවක්නෙ කිව්වේ. මට අර පාදනමස්කාරය යාච්ඤාව කියන්න බැරි නිසා . මාව ගෙදර පඩි පෙලෙන් ලිස්සලා වැටුණා. කකුල කැඩෙන්න නැතිව යාන්තමෙන් බේරුණා. ඒක ලොකු දෙයක් කියලා ඩොක්ටත් කිව්වා''.''ඔයා කියන්න හිටිය පාද නමස්කාර යාච්ඤාව මමයි කියෙව්වේ. මං ඔයා වෙනුවෙන් යාච්ඤා කළා. මටත් කවදහරි හිනිදුම පාද නමස්කාරය කරන්න ලැබෙන්න කියලත් යාච්ඤා කළා''. එසේ කියමින් තුසිත තම යාළුවගේ කරට අතදාගෙන දහම් පාසල් භූමියෙන් ඉවතට ගියා. දෙදෙනාම දේවස්ථානයට ඇතුළු වුණේ අලුත් පියතුමෙක් දහම් පාසල් සිසු දරුවන්ට පාපොච්චාරණය දෙන අවස්ථාවේදීය. දෙදෙනම දිව්‍යසත්ප්‍රසාදීය ජේසු ඉදිරියේ දණ ගැසුවේ යහපත් පාපොච්චාරණයක් කිරීමටයි.

**එල්සි මුදලිගේ නැන්දා - මීගමුව**

## දෙවිඳුන්ගේ ප්‍රේමය...



**මෙලොවට වැඩිය ජේසුනී......**
**කුරුසියේ දී දිවි පිදුවේ**
**පාපයෙන් මා මුදවා ගත්තේ**
**ලේ දහරාගලා ගියේ දෙවිඳුනි**
**ඔබ අප කෙරෙහි ඇති ප්‍රේමය නිසයි....**

**සෙනෙහස ගලා ගියේ**
**දෑත් සිදුරු වුනේ,**
**ඝන අඳුර දුරු වුනේ,**
**ජේසුනි ඔබේ ආදරේ නිසයි**
**ඔබේ ආදරේ මට දැනෙනවා ජේසුනි....**

**නිමාෂා ගමගේ**
2014 අ.පො.ස (සා.පෙළ)
සා. ආනා දහම් පාසල - සරික්කාලිමුල්ල (පානදුර මීසම)

# ප්‍රහේලිකා අංක 51



### හරහට

1. ශු. බයිබලයේ අවසාන පොතේ නම

5. ක්‍රිස්තුන් වහන්සේ ධනවත් ප්‍රධානියාට කථා කොට, ''ඔබ ........... .............................. සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න. එවිට ස්වර්ග යෙහි ඔබට සම්පත් ඇති වන්නේය'' යැයි වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ මහා ...................................... කට සුවසෙත උදාකල බව ශු. මතෙව් තුමා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මරියතුමිය ක්‍රිස්තුන් වහන්සේව .................................... දරා සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. යාච්ඤාව සඳහා දේව මාළිගාවට ගිය අයකැමියා තම ......................ට ගසා ගනිමින් ''දෙවියන් වහන්ස , පව්කාරවූ මා හට කරුණා කළ මැනව. ''යි කීය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

### පහළට

1. මෙම දිවැසිවරයා යාච්ඤා කළ විට, වැසි වැස තුන් අවුරුද්දක් රට පුරා පැවති නියඟය කෙළවර විය.

2. සීනයි කන්දේදී දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට මෙය දුන් සේක.

3. මෝසෙස්තුමා ප්‍රමුඛ ඊශ්‍රායෙල් ජනතාවට ගමන් කරනු සඳහා දෙවියන් වහන්සේ මෙම මුහුද දෙබෑකර එය මැදින් වියලි බිමක් සෑදූ සේක.

4. දෙවියන් වහන්සේ කතා කරමින් '' ඔබේ පාද වලින්....................... .... ගලවා දමන්න. ඔබ සිටින ස්ථානය ශු. භූමියෙකැ''යි මෝසෙස් තුමාට වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

06. දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව කාන්තාරය මැදින් ගමන් කරන විට ප්‍රාතිහාර්යකින් මේවා ලබා දුන් සේක.

07. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ අවස්ථාවලදී මොවුන් වැඩී සිටි අයට සුවය ලබාදුන් සේක.

මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ජුවාම් 19, ශු. ලූක් 18, නික්මයාම 3, 14, 18, 1 රාජාවලිය 17,18, ශු. මතේව් 4

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

**නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේලිකා අංක 51, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

## පිටකවරයේ සිත්තරාවිය

**මෙවර ළමා ප්‍රදීපයේ පාස්කු කාලපයේ පිට කවරය සිතුවම් කරන ලද්දේ ගයනි තරුෂිකා මෙනවියයි. ඇය කුඩා කළ සිටම චිත්‍ර කලාවට දස්කම් දක්වා ජයග්‍රහන රැසක් ලබා ඇත. වැලිවිට මීසමේ දියණියක වන තරුෂිකා වැලිවිට ශා. මරියා දේවස්ථානයේ "සුනිමල" දහම් පාසලේ ආචාර්ය මඩුල්ලේ සේවය කරයි. ඇය 2014 වසරේ බුද්ධශාසන, ආගමික කටයුතු ආමාත්‍යංශය හා ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තුමේන්තුව ඒකාබද්ධව සංවිධාන කරන ලද දීප ව්‍යාප්ත නත්තල් සුබ පැතුම් පත් තරගයේදී පළමු ස්ථානය දිනා ගනු ලැබුවාය. ගයනි තරුෂිකා සිත්තරාවියට ළමා ප්‍රදීපය ශුභ පැතුම්! (කුමර)**

## ඉදිරි සතිතුනේ ළමා ප්‍රදීපය නිකුත් නොවේ....

**පළමු වාරය අවසන් වී පාසල් නිවාඩුව ඇරඹීම හා පාස්කු හා අළුත් අවුරුදු නිවාඩුවට කොළඹ කතෝලික මුද්‍රණාලය වසා තිබෙන බැවින් 2015 අප්‍රේල් 06, 13, හා 20 (සති 3ක්) ළමා ප්‍රදීපය පුවත්පත මුද්‍රණය නොවන බැව් කරුණාවෙන් සලකන්න.**

**නැවතත් සුපුරුදු පරිදි අප්‍රේල් 27 වන සඳුදා දින සිට ළමා ප්‍රදීපය පුවත්පත නිකුත් කෙරේ. මේ නිවාඩු කාලයේදී අපේ දුවලා පුතාලාගේ නිර්මාණ මෙන්ම නව අදහස් හා යෝජනාද අප වෙත යොමු කරන්න.**

**සංස්කාරක පියතුමා**

# ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියේ ගමන් මග...













ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සිය කුරුසියේ ගමන් මග යාමට ප්‍රථම සිය පියාණන් වූ දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුකිරීමට විවිධ ක්‍රියාවන් ඉටු කළ සේක. ජනතාව උන් වහන්සේව රජෙක් ලෙස පිළිගනු ලැබුවේ 'ගොබ් ඉරිදා' දින දීය. ඉන් පසු පිලාත් උන් වහන්සේව මරණයට නියම කිරීමත්, උන් වහන්සේ උකුත් වී නැවත උත්ථාන වීමත් මෙම කුරුසියේ ගමන් මඟ තුළ සුවිශේෂී සංධිස්ථානයන්ය. හොරුන් අපරාධකාරයින් වඳ බන්ධනයට පත් කරනු ලබන මරණයේ සංකේතයක් වූ කුරුසිය උන් වහන්සේ සදාතන ජීවනයේ හා ගැලවීමේ සංකේතය බවට පත්කළ සේක.

**සිතුවම් :**

**මර්සලීන් හීන්කෙන්ද**